## 2021 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව

## ආයතනයේ නම : ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

## වැය ශීර්ෂ අංක : 2201

**අන්තර්ගතය** **පිටු අංක**


පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය............................. 2-4

පරිච්ඡේදය 02-ප්‍රගතිය සහ ඉදිරිදැක්ම................................................................. 5-15

පරිච්ඡේදය 03- වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය....................................... 16-77

පරිච්ඡේදය 04- කාර්ය සාධන දර්ශක.......................................... 78

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය...... 79-80

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ...................................................... 81-82

පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තා............................................................................ 83-93

## පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1හැඳින්වීම

1972 අංක දරන කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව 1978 පෙබරවාරි මස 02 වන දින නිකුත් කරන ලද අංක 302/12 දරණ අතිවිශේෂ ගැසට් නියෝගය මඟින් ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධන අධිකාරිය (NADSA) ස්ථාපනය කර ඇත. උක්ත ගැසට් නිවේදනය මඟින් පහත කාර්යන් ඉටු කිරීම සඳහා අධිකාරිය වෙත නෛතික ප්‍රතිපාදන ලබාදී ඇත.

1. කෘෂිකාර්මිකවිවිධාංගීකරණය,ජනාවාස සංවර්ධනය සහ පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම සහ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රදේශවල සංස්ථාව විසින් හෝ ආණ්ඩුවේ නැතහොත් ආණ්ඩුවේ නොවන නියෝජිත ආයතන මඟින් හෝ සැලසුම් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම.
2. සංස්ථාව වෙත සතු කරන ලද හෝ පවරන ලද සියළු ඉඩම්, උපරිම ඵලදාව, පරිසරය රැකීම, ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය සහ ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය කිරීම.
3. කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවි කිරීම.
4. කෘෂිකාර්මික විවිධාංගීකරණය සහ ජනාවාස සංවර්ධනය සඳහා පිරියත, උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
5. (1) වන ඡේදයෙහි නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ දිය බෙත්ම කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන සියළු පියවර ක්‍රියාත්මක කිරීම.

1991 දෙසැම්බර් මස 07 වන දින නිකුත් කරන ලද අංක 678/15 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මෙලෙස ක්‍රියාත්මක වූ නැඩ්සා ආයතනයෙහි නිල නාමය හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය (හදබිම අධිකාරිය) ලෙස සංශෝධනය විය. මෙම සංශෝධනය සමඟ කෑගල්ල සහ මහනුවර දිස්ත්‍රික්කයන් හට පමණක් සීමා වූ අධිකාරියේ සංවර්ධන බල ප්‍රදේශ නුවරඑළිය, මාතලේ, රත්නපුර, බදුල්ල, කෑගල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වලට ව්‍යාප්ත කරන ලදී. 2016 මාර්තු මස 18 වන දිනැති අංක 1958/72 දරණ ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරීම සිදු කරන ලද අතර නැවත 2018 මැයි මස 12 වැනි දිනැති අංක 2070/56 දරණ විශේෂ ගැසට් නිවේදනය අනුව හදබිම අධිකාරිය යලි කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුයුක්ත විය.

2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මහනුවර, මාතලේ, නුවරඑළිය, හම්බන්තොට හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්ගේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර වර්ෂය අවසාන වන විට සාර්ථක ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත.

01. පාංශු ඛාදනයට හා හායනයට ලක්ව ඇති කෘෂිකාර්මික ඉඩම් වල පාංශු සංරක්ෂණය හරහා තිරසාර ලෙස ඉඩම් කළමණාකරණය කොට පාංශු ඵලදායීතාවය ඉහල නැංවීම අරමුණු කොට ගනිමින් පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීමේ වැඩසටහනක් මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක විය.

02. දීර්ඝ කාලීනව අවිධිමත් ලෙස රසායනික පොහොර හා කෘෂි රසායන යෙදීම හරහා පරිහානියට පත් ව ඇති කෘෂිකාර්මික ඉඩම් කාබනික පොහොර යෙදීම හරහා ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණු සහිතව කාබනික පොහොර නිෂ්පාදනය වැඩසටහනක් මහනුවර, මඩකලපුව සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්ගේ ක්‍රියාත්මක විය.

03. පාංශු සංරක්ෂණය හා කාබනික පොහොර නිෂ්පාදනය පිලිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීම හා ඔවුන් තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ කිරීම අරමුණු කොට ගනිමින් ගොවි ප්‍රජාව වෙත න්‍යායාත්මක හා ප්‍රායෝගික තාක්ෂණ පුහුණු වැඩසටහන් මහනුවර, මාතලේ, හම්බන්තොට හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්ගේ ක්‍රියාත්මක විය.

04. විවිධ මානව ක්‍රියාකාරකම් නිසා පරිහානියට පත්ව ඇති ජල මූලාශ්‍ර සංරක්ෂණය අරමුණු කොට ගනිමින් ජල මූලාශ්‍ර හා දියකඳුරු සංරක්ෂණ වැඩසටහනක් මහනුවර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක විය.

05. කෘෂි නිෂ්පාදන අලෙවිකරණය අරමුණු කොට ගනිමින් ශ්‍රී ලංකා හදබිම අධිකාරියට අයත් කොත්මලේ සහ පල්ලේකැලේ ගොවිපල සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක විය.

06. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී ග්‍රාමීය ජනතාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ ජීවන තත්වය නඟා සිටුවීම හා අතිරේක ආදායම් මාර්ග උත්පාදනය සඳහා එළවළු පැල තවාන්, මල් පැල තවාන්, බිම්මල් වගාව, කාබනික පොහොර නිෂ්පාදනය වැනි ආදායම් උත්පාදන ව්‍යාපෘතීන් හඳුන්වා දීම හා ඒ පිලිබඳ ඔවුන්ට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික තාක්ෂණ පුහුණු වැඩසටහන් ලබාදීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

07. ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ පෝෂණ තත්වය නඟා සිටුවීමේ අරමුණු සහිතව ග්‍රාමීය ප්‍රජාවගේ දෛනික සත්ත්ව ප්‍රෝටීන පරිභෝජනය ඉහළ නැංවීම හා අතිරේක ආදායම් මාර්ග උත්පාදනය සඳහා අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලන වැඩසටහනක් මහනුවර දිස්ත්‍රික්කය ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක විය.

08. සමස්ත සංවර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ භෞතික සංවර්ධනය අරමුණු කොට ගනිමින් ප්‍රජා සුබසාධන හා ආයතනික කටයුතු සඳහා වැඩසටහන් ක්‍රියාත්මක විය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් වසර 2030 වන විට සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක අතර ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මගින් තිරසර සංවර්ධන ඉලක්ක 01 වන සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම, තිරසර සංවර්ධන අරමුණු 02 වන සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනා ගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම, තිරසර සංවර්ධන අරමුණු 13 වන දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සහ තිරසර සංවර්ධන අරමුණු 15 වන භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා

කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන අරමුණු සපුරා ගැනීම සඳහා සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

## 1.2 ආයතනයේ දැක්ම , මෙහෙවර සහ අරමුණු

**දැක්ම**

- තිරසර ඉඩම් හා ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා වන සේවා විශිෂ්ඨත්වයක් තුළ හරිත වූ පරිසරයක් සරු ඵල සපිරි රටක්

**මෙහෙවර**

- ඵලදායී ඉඩම් කළමනාකරණය, විධිමත් ජල සංරක්ෂණයක් හා උසස් මානව සම්පත් උපයෝජනය තුළින් පාරිසරික සම්පත් සංරක්ෂණය හා කෘෂි ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා අවශ්‍යාදායකත්වය ලබාදීම.

**අරමුණු**

01. කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය හා පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
02. සංස්ථාව වෙත සතු කරන ලද ඉඩම් වල උපරිම ඵලදායීතාවය, පරිසරය රැකීම, ඉඩම් හා ජල සම්පත් සංරක්ෂණය හා ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය.
03. කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම හා අලෙවිකරණය.
04. කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධනය සඳහා විවිධ උපකරණ සැපයීම හා නඩත්තු කිරිම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

1. ජල පෝෂක කළමනාකරණය සහ සංරක්ෂණය කිරීම.
2. පාංශු ඛාදනය සහ හායනය අවම කරමින් තිරසර ඉඩම් ඵලදායීතාවය ඉහළ නැංවීම.
3. බෝග විවිධාංගීකරණය මත පදනම්ව කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීම.
4. කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ඉහළ නැංවීම.
5. කෘෂි ව්‍යවසායකයින් සවිබල ගැන්වීම.
6. කුඩා පරිමාණ ග්‍රාමීය සත්ව පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. කෘෂි නිෂ්පාදන මත පදනම් වූ ව්‍යවසායකයින් දිරිගැන්වීම සහ වෙළඳපොළ අවස්ථාවන් පුළුල් කිරීම.
8. ගොවීන් සඳහා විෂයානුබද්ධ තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම.

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
## සංවිධාන ව්‍යුහය



## පරිච්ඡේදය 02 : ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

## 2021 වසරේ ක්‍රියාත්මක කරනු ලැබු සංවර්ධන ව්‍යාපෘතීන් සහ ප්‍රගතිය

2021 වර්ෂයේ දී ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන සඳහා රු.මි.100 ක ප්‍රතිපාදන මුදලක් මහ භාණ්ඩාගාරය හරහා අප අධිකාරිය වෙත ලැබී ඇත.

| වෙන් කළ මුදල (රු.මි.) | වැය වු මුදල (රු.මි.) | මුල්‍යා ප්‍රගතියේ ප්‍රතිශතය (%) |
|---|---|---|
| 100 | 99.96 | 99.97 |

### 2.1 විෂය පථය 01 - ඉඩම් ඵලදායීතාව උපරිම මට්ටකට ගෙන ඒම.

#### 2.1.1 පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම.

පාංශු ඛාදනය හා පාංශු හායනය නිසා මධ්‍යම කඳුකරය ආශ්‍රිත කෘෂිකාර්මික ඉඩම් බොහෝමයක් පරිහානියට පත්ව ඇත. ඉඩම් පරිහරණ රටාවේ වෙනස්වීම්, වනාන්තර විනාශය සහ නාගරීකරණය හේතුවෙන් පාංශු ඛාදනය හා පසේ සාරවත් බව පහල යාම දැඩි පාරිසරික ගැටළුවකි. එමෙන්ම මින් ඇතිවන අතුරු ප්‍රතිඵලය වන්නේ සෝදායන පාංශු අංශු රොන්මඩ වශයෙන් තැන්පත් වීම නිසා ජලාශ වල ජලය ගබඩා කිරීමේ ධාරිතාවය පහල යාමෙන් ජල විදුලි උත්පාදනය සඳහා ගැටළු පැන නැඟීමයි. එමෙන්ම දීර්ඝ කාලීනව පාංශු ඛාදනය නිසා ඇති වන අතුරු ප්‍රතිඵල වන්නේ ගංවතුර ඇති වීම, නායයාම් ඇති වීම, ගංගා ඉවුරු ඛාදනය වීම, වාරිමාර්ග වල අවහිර වීම් සහ නියඟයි. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වල සාරවත් බව පහල යාම සඳහා බලපාන ප්‍රධාන හේතුව වන්නේ පාංශු ඛාදනයයි. එම නිසා පාංශු සංරක්ෂණය කෘෂිකාර්මික ඉඩම් වල ඵලදායීතාව ඉහල නංවා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වේ.

කෘෂිකාර්මික ඉඩම් වල පාංශු සංරක්ෂණ ක්‍රම 3ක් හරහා සිදු කෙරේ.

| | | |
|---|---|---|
| I. | යාන්ත්‍රික සංරක්ෂණය | -ගල් වැටි, පස් වැටි, කුට්ටි කාණු, හෙල්මළු, සමෝච්ච වේදිකා |
| II. | ජීව විද්‍යාත්මක සංරක්ෂණය | -සැවැන්දරා වැටි, ආවරණ වගා, තෘණ වැටි, දෙවැටි, වන වගා, සුළං බාධක වැටි, බහු වාර්ෂික බෝග වගාව |
| III. | ශෂ්‍ය විද්‍යාත්මක සංරක්ෂණය | -සමෝච්ච බිම් සැකසීම, කාබනික පොහොර යෙදීම, වසුන් යෙදීම, අවම බිම් සැකසීම හා අතුරු බෝග වගාව |

කෘෂිකාර්මික ඉඩම් වල ස්වභාවය හඳුනා ගනිමින් පාංශු සංරක්ෂණ ක්‍රම එකක් හෝ කිහිපයක් යොදා ගනිමින් පසේ සාරවත් බව ආරක්ෂා කර ගත හැක.

2021 වර්ෂයේ දී ඉඩම් ඵලදායිතාව උපරිම මට්ටමකට ගෙන ඒම අරමුණු කොට ගනිමින් පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක විය.

මෙම පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීමේ වැඩසටහන අදියර 2 ක් ලෙස ක්‍රියාත්මක විය. එයට හේතුව වූයේ 2020 වර්ෂයේ අප අධිකාරිය වෙත ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් නොවූ හෙයිනි. එම නිසා 2020 වර්ෂයේ දී පාංශු සංරක්ෂණ වැඩසටහන හරහා පාංශු සංරක්ෂණය ව්‍යුහ හෙක්ටයාර 814.62 ක් ස්ථාපිත කරන ලද අතර ඒ සඳහා ප්‍රතිලාභීන් වෙත 2021 වර්ෂයේ එම වැඩසටහන සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදලින් අතැති බිල්පත් ලෙස රු.මි.8.146 ක මුදලක් ගෙවීමට සිදු විය.

| විෂය පථය | ක්‍රියාකාරකම | | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික | මූල්‍ය (රු.මි.) |
| 1.ඉඩම් ඵලදායීතාවය උපරිම මට්ටමකට ගෙන ඒම | 1.1 | පාංශු සංරක්ෂණ ක්‍රම ස්ථාපිත කිරීම - 2020 | හෙක්ටයාර | 814.62 | 8.15 | 814.62 | 8.146 |
| | | පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම - 2021 | හෙක්ටයාර | 948.00 | 23.70 | 948.00 | 23.698 |

2021 වර්ෂයේ දී පාංශු සංරක්ෂණ ව්‍යුහ හෙක්ටයාර 948 ක් ස්ථාපිත කිරීම සඳහා රු.මි. 23.70 ක ප්‍රතිපාදන මුදලක් වෙන් වූ අතර එම මුදලින් රු.මි. 23.698 ක මුදලක් වැය කරමින් පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කළ ප්‍රතිලාභීන් වෙත දිරි දීමනා ලෙස ලබා දී ඇත.

එමෙන්ම 2021 වර්ෂය අවසානයේ දී ඉලක්ක ගත ප්‍රමාණයට සාපේක්ෂව තවත් හෙක්ටයාර 165 ක සංරක්ෂණ කටයුතු භෞතිකව සිදු වි තිබුණ ද අය වැය චක්‍රලේඛ අංක 03/2021 ප්‍රකාරව අදාල වන ගෙවීම් සිදු කිරීමට නොහැකි වූ බැවින් 2022 වර්ෂයේ දී එම ගෙවීම් සිදු කිරීමට සැලසුම් කර ඇත.

### 2.1.2 කාබනික පොහොර නිෂ්පාදනය

ඉඩමේ ඵලදායීතාවය උපරිම මට්ටමකට ගෙන ඒම අරමුණු කොට ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රචලිත කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. එමෙන්ම වර්තමානයේ දී රාජ්‍ය ප්‍රතිපත්ති අනුව රසායනික පොහොර මෙරටට ආනයනය කිරීම නවතා ඇති අවධියක බෝග සඳහා අවශ්‍ය පොහොර අවශ්‍යතාවය කාබනික පොහොර හරහා ලබාදීම හා පාංශු ඵලදායීතාව ඉහළ නැංවීම මෙම වැඩසටහනේ අරමුණයි.

මෙම වැඩසටහන මඟින් කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව තාක්ෂණික දැනුම ප්‍රායෝගිකව හා න්‍යායාත්මකව ගොවි ජනතාව වෙත ලබාදීම සිදු කෙරේ.

2020 වර්ෂයේ දී මහ භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද ප්‍රතිපාදන සීමිත වූ බැවින් මෙම වැඩසටහන ද අදියර 02 ක් ලෙස ක්‍රියාත්මක විය.

| විෂය පථය | ක්‍රියාකාරකම | | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික | මූල්‍ය (රු.මි.) |
| 1. ඉඩම් ඵලදායීතාව ඉහළ නැංවීම | 1.2 | කාබනික පොහොර නිෂ්පාදනය - 2020 | ගොවීන් | 2584 | 10.441 | 2584 | 10.441 |
| | | කාබනික පොහොර නිෂ්පාදනය - 2021 | ගොවීන් | 8136 | 32.084 | 8136 | 32.084 |

2020 වර්ෂය සඳහා කාබනික පොහොර නිෂ්පාදනය කරන ලද ගොවීන් 2584 ක් සඳහා කෘෂි උපකරණ කට්ටල 2021 වර්ෂයේ දී එම වැඩසටහන සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයෙන් ලබා දුන් අතර ඒ සඳහා රු.මි.10.441 ක් වැය විය. මෙම වැඩසටහන හරහා කාබනික පොහොර මෙට්‍රික් ටොන් 01 ක් නිෂ්පාදනය කරන ලද ගොවීන් සඳහා කෘෂි උපකරණ කට්ටලයක් (9*9" උදළු තලය, ලීටර් 10 මල් බාල්දිය, ලී මිට සහිත සවල, ඇඟිලි 04 උදලු මුල්ලුව සහ රේක්කය) බැගින් ලබා දීම සිදු විය.

2021 වර්ෂයේ දී කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන මහනුවර, මඩකලපුව හා හම්බන්තොට යන දිස්ත්‍රික්කයන් ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක විය. ඒ අනුව එම දිස්ත්‍රික්කයන්ගේ කාබනික පොහොර නිෂ්පාදනය කරන ලද ගොවීන් 8136 ක් සඳහා කෘෂි උපකරණ කට්ටල (9*9 " උදළු තලය,10 L මල් බාල්දිය, ලී මිට සහිත සවල, උදළු මුල්ලුව හා තාච්චිය) බැගින් ලබා දීම සිදු විය.

එමෙන්ම අයවැය චක්‍රලේඛ අංක 03/2021 අනුව 2021 වර්ෂයේ දී කෘෂි උපකරණ ලබා දීමට නොහැකි වූ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවීන් 651 ක් සඳහා කෘෂි උපකරණ කට්ටල 2022 වර්ෂයේ දී ලබා දීමට නියමිතය.

### 2.1.3 තාක්ෂණික පුහුණුව

2021 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් සියළුම ප්‍රතිලාභීන් ඉලක්ක කර ගනිමින් ගොවි ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක විය. එහි දී පාංශු සංරක්ෂණය, කාබනික පොහොර නිෂ්පාදනය සඳහා න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්විණි.

| විෂය පථය | ක්‍රියාකාරකම | | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) |
| 1.ඉඩම් ඵලදායීතාව උපරිම මට්ටමට ගෙන ඒම. | 1.3 | තාක්ෂණික පුහුණුව | ගොවීන් | 4150 | 0.16 | 4291 | 0.16 |





රූපය 1: කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ ගොවි ප්‍රජාව දැනුවත් කිරීම

රූපය 2: පාංශු සංරක්ෂණ තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම

## 2.2 විෂය පථය 02 - පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමණාකරණය

### 2.2.1 ජල මූලාශ්‍ර හා දිය කඳුරු සංරක්ෂණය කිරීම.

විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් හානියට පත්ව ඇති ජල මූලාශ්‍ර හා ඒ අවට පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම, එම ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනීම සහ ඔවුන්ට කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම අරමුණු කොට ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

2021 වර්ෂයේ දී මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 18 හි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට 01 බැගින් ජල මූලාශ්‍ර 18 ක් තිරසාර ලෙස සංරක්ෂණය කර ඇත. එහි දී එක් ජල මූලාශ්‍රයකට රු.250,000.00 බැගින් රු.මි. 4.267 ක ප්‍රතිපාදන මුදලක් සංරක්ෂණ කටයුතු සඳහා වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 2021 වර්ෂය අවසානයේ දී රු.මි. 4.251 ක මුදලක් වැය කරමින් ජල මූලාශ්‍ර 18 ක සංරක්ෂණ කටයුතු අවසන් කර ඇත.

සංරක්ෂණය කරන ලද ජල මූලාශ්‍ර වන්නේ,

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාමනිලධාරි වසම | සංරක්ෂණය කරන ලද ජල මූලාශ්‍රය |
|---|---|---|---|
| 1 | පස්බාගේ කෝරලේ | දඩුබැදිරුප්ප | සෝලන්කන්දනව ගම්මානය |
| 2 | ගඟඉහළ කෝරලේ | පැල්ලපිටිය උතුර | ලෙව්වම් පිහිල්ල |
| 3 | උඩපලාත | දුනුකේඋල්ල | බෝමන් ජනපද උල්පත |
| 4 | දොළුව | පුපුරුස්ස | යැරෝ හඳබිම වැව උල්පත |
| 5 | දෙල්තොට | පේරවත්ත නැගෙනහිර | හපුවැල්මාන ඇළේපන්සල අසල දිය පිහිල්ල |
| 6 | පාතහේවාහැට | ශ්‍රියාගම | අම්බලමාන ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය |
| 7 | හාරිස්පත්තුව | සීවලිකන්ද | කැටපොත පිහිල්ල |
| 8 | ගලගෙදර | පල්ලේකොටුව | වලව්වේ කුඹුර යායේ පිහිල්ල |
| 9 | පූජාපිටිය | දොලපිහිල්ල දකුණ | ඊරියගහදෙනිය පිහිල්ල |
| 10 | උඩුනුවර | නිකහැටිය | තොටිල්ලගොල්ලනාන පිහිල්ල |
| 11 | යටිනුවර | මොරගොල්ල | මොරගහඇලේදිය පීල්ල රක්ෂිතය |
| 12 | හතරලියද්ද | වල්පලාගොල්ල | බෝලගල ළිඳ සංරක්ෂණය |
| 13 | පාතදුම්බර | ගුණැම්බිල්ල | නල්ල තන්නිය ජල මූලාශ්‍රය |
| 14 | පන්විල | මඩොල්කැලේ | අංක 9 පිහිටි ජල මූලාශ්‍රය |
| 15 | කුණ්ඩසාලේ | හීපිටිය | මහීපිටිය පිහිල්ලකුඹුර ජල මූලාශ්‍රය |
| 16 | මැදදුම්බර | දකුණු දොරලියද්ද | හීල්ල ජල මූලාශ්‍රය |
| 17 | උඩුදුම්බර | පෝප්පිටිය | පෝප්පිටිය ජල මූලාශ්‍රය |
| 18 | මිනිපේ | වරාගොල්ලනැගෙනහිර | ඇටඹගහ උල්පත ජල මූලාශ්‍රය |



සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

**රූපය 3: මහනුවර දිස්ත්‍රිකයේ ගඟඉහළ කෝරලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ලෙව්වම් පිහිල්ල ජල මූලාශ්‍රය**

## 2.3 විෂය පථය 03 - කෘෂි නිෂ්පාදන හා අලෙවිකරණ වැඩසටහන

### 2.3.1 ගොවිපල සංවර්ධනය - පල්ලේකැලේ

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ප්‍රධානතම ආදායම් උත්පාදන ව්‍යාපෘතිය මෙයයි. විශේෂයෙන්ම කුකුළු පැටවුන් අභිජනන මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යනු ලබන මෙම ගොවිපල තුල අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පැටවුන් අභිජනනය කිරිම, බෝග වගාව සහ කිරිගව පාලනය සිදු කරයි. 2021 වර්ෂයේ දී මෙම ගොවිපල සඳහා රු.මි. 0.252 ක් ප්‍රතිපාදන මුදලක් ජල මෝටරයක් ලබා ගැනීම සඳහා වෙන් කරන ලද අතර වර්ෂය අවසානයේ දී රු.මි. 0.251 ක් වැය කරමින් එම ජල මෝටරය මිල දී ගෙන ගොවිපල සඳහා වන ජල අවශ්‍යතාවය සපුරා ගෙන ඇත.





**රූපය 4: පල්ලේකැලේ ගොවිපල හරහා සිදු කරන ලබන කුකුළු පාලනය හා කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන්**

## 2.3.2 ගොවිපල සංවර්ධනය - කොත්මලේ

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ අනෙක් ප්‍රධානතම ආදායම් උත්පාදන ව්‍යාපෘතිය වන්නේ මෙයයි. සමෝධානික ගොවිපල සංකල්පය යටතේ බෝග වගාව, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සත්ව පාලනය මෙම ගොවිපල මඟින් සිදු කරනු ලැබේ. 2021 වර්ෂයේ දී කොත්මලේ ගොවිපල සංවර්ධනය සඳහා රු.මි. 0.47 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලද අතර එම වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලින් රු.මි. 0.469 ක මුදලක් වැය කොට ගොවිපලේ ට්‍රැක්ටරය සඳහා නව තට්ටුවක් (ට්‍රේලරයක්) මිල දී ගෙන ඇත.





**රූපය 5: කොත්මලේ ගොවිපල හරහා සිදු කරන ලබන ඉහළ ගුණාත්මයේ පැල නිෂ්පාදන වැඩසටහන්**

## 2.4 විෂයපථය04 - ග්‍රාමීය ප්‍රජාවගේ පෝෂණ අවශ්‍යතාවයසපුරාලීම සහ ආදායම් උත්පාදනය

### 2.4.1 බහුවිධ ආදායම් උත්පාදන වැඩසටහන - 01

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී ග්‍රාමීය ජනතාව ඉලක්ක කොට ගනිමින් ඔවුන්ගේ ජීවන තත්වය නඟා සිටුවීම සඳහා එළවළු පැල තවාන්, මල් පැල තවාන්, බිම්මල් වගාව, මල් පෝච්චි සකස් කිරීම හා කාබනික පොහොර නිෂ්පාදනය වැනි වැඩසටහන් හඳුන්වා දීම මෙම වැඩසටහන හරහා සිදු විය. එමෙන්ම ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ගොවින් වෙත අවශ්‍ය වන න්‍යායාත්මක හා ප්‍රායෝගික තාක්ෂණික දැනුම ලබාදුන් අතර එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ ලබාදීම ද මෙම වැඩසටහන හරහා සිදු විය.

මෙම ව්‍යාපෘතිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට, සූරියවැව, ලුණුගම්වෙහෙර, තිස්සමහාරාමය, අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ප්‍රතිලාභීන් 93ක් ඉලක්ක කොටගෙන ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා රු.මි. 8.46 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත. 2021 වර්ෂය අවසානයේ දී රු.මි. 8.463 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් උපයෝගී කර ගනිමින් ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කොට ඇත.





රූ රූපය 6 : හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී ග්‍රාමීය ජනතාව සඳහා න්‍යායාත්මක හා ප්‍රායෝගික තාක්ෂණික දැනුම ලබා දීම සහ අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ ලබාදීමේ වැඩසටහන

### 2.4.2 බහුවිධ ආදායම් උත්පාදන වැඩසටහන - 02 අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලනය ප්‍රචලිත කිරීමේ වැඩසටහන

ප්‍රෝටීන ශක්ති මන්ද පෝෂණය ග්‍රාමීය ජනතාව අතර පවතින උග්‍ර ගැටළුවක් බවට වර්තමානයේ දී පත්ව ඇත. එම නිසා ග්‍රාමීය ප්‍රජාවගේ දෛනික සත්ව ප්‍රෝටීන පරිභෝජනය ඉහල නැංවීම මෙන්ම ඔවුන්ට අතිරේක ආදායම් මාර්ගයක් උත්පාදනය කිරීමේ අරමුණින් අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහනක් ග්‍රාමීය ජනතාව වෙත හඳුන්වා දීම මෙම වැඩසටහන හරහා සිදු කරයි.

මෙම වැඩසටහන මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 18 ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක වු අතර 2021 වර්ෂයේ දී කුකුළු පැටවුන් 18260 ක් ගොවි පවුල් 1826 ක් ඉලක්ක කරමින් ලබා දීමට නියමිත වු අතර ඒ සඳහා රු.මි 6.847 ක් වැය කිරීමට සැලසුම් ගත කොට තිබුණි. 2021 වර්ෂය අවසානයේ දී කුකුළු පැටවුන් 18260 ක් ගොවීන් අතර බෙදා දුන් අතර ඒ සඳහා රු.මි. 6.847 ක් වැය විය.




**රූපය 7 : කුකුල් පැටව් ග්‍රාමීය ජනතාව වෙත බෙදා දීමේ වැඩසටහන**

| අනු අංකය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ගොවි පවුල් ගණන | කුකුල් පැටව් ප්‍රමාණය | වටිනාකම (රු.ශත) |
|---|---|---|---|---|
| 1 | හතරලියද්ද | 65 | 650 | 243,750.00 |
| 2 | උඩුනුවර | 105 | 1050 | 393,750.00 |
| 3 | යටිනුවර | 110 | 1100 | 412,500.00 |
| 4 | පාතහේවාහැට | 90 | 900 | 337,500.00 |
| 5 | මැදදුම්බර | 175 | 1750 | 656,250.00 |
| 6 | පස්බාගේකෝරලේ | 110 | 1100 | 412,500.00 |
| 7 | ගඟඉහළ කෝරලේ | 200 | 2000 | 750,000.00 |
| | | 45 | 450 | 168,750.00 |
| 8 | හාරිස්පත්තුව | 136 | 1360 | 510,000.00 |
| 9 | පස්බාගේකෝරලේ | 150 | 1500 | 562,500.00 |
| 10 | දොළුව | 83 | 830 | 311,250.00 |
| | උඩපළාත | 77 | 770 | 288,750.00 |
| 11 | දොළුව | 160 | 1600 | 600,000.00 |
| | උඩපළාත | | | |
| 12 | කුණ්ඩසාලේ | 160 | 1600 | 600,000.00 |
| 13 | උඩුනුවර | 160 | 1600 | 600,000.00 |
| **එකතුව** | | **1826** | **18260** | **6,847,500.00** |

## 2.5 විෂය පථය 05 - ප්‍රජා සුබසාධන හා ආයතනික කටයුතු

### 2.5.1 විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් පිලිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරිම සඳහා කඳුරට FM. ගුවන් විදුලිය සමඟ ඒකාබද්ධව "හදබිම ගැමි සරණිය" සහ "හදබිමෙන් ගොවිබිමට" නමින් වැඩසටහන් වර්ෂය පුරා ක්‍රියාත්මක වීම. එහි දී "හදබිම ගැමි සරණිය" වැඩසටහන් 10 ක් සහ "හදබිමෙන් ගොවිබිමට" වැඩසටහන් 20 ක් වර්ෂය තුල සිදු කිරිමට අපේක්ෂා කරන ලද අතර ඒ සඳහා රු.මි. 0.535 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කිරිමට සැලසුම් කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂය අවසානයේ දී ඉලක්ක ගත වැඩසටහන් සියල්ල අවසන් කරන ලද අතර ඒ සඳහා රු.මි 0.533 ක මුදලක් වැය කොට ඇත.

### 2.5.2 මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

2021 වර්ෂයේ දී ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා ආයතනයේ ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් මාසිකව සමාලෝචනය කිරීම මේ හරහා සිදු කෙරේ. 2021 වර්ෂයේ දී මාසික ප්‍රගති සමාලෝචන වැඩසටහන් 12ක් පැවැත්වීමට සැලැසුම් ගත කොට තිබුණ ද පැවැති කොරෝනා වසංගත තත්වය නිසා නිරෝධායන නීති වලට අනුගත වෙමින් පුද්ගල ඒකරාශී වීම් සිදු කිරීමට අපහසු වීම නිසා ඉලක්ක ගත කරන ලද රැස්වීම් වලින් 07 ක් පමණක් පැවැත්වු අතර ඒ සඳහා රු.මි. 0.183 ක මුදලක් වැය කර ඇත.

### 2.5.3 භෞතික සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය වන කාර්යාලීය උපකරණ සහ විද්‍යුත් මෙවලම් මිල දී ගැනීම සහ නඩත්තුව සඳහා 2021 වර්ෂය තුල රු.මි.4.405 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලද අතර එම ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මි. 4.399 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වැය කරමින් රැස්වීම් ශාලාව සඳහා පුටු මිලදී ගැනිම, ඉදිකිරීම් උපකරණ මිලට ගැනිම, ශබ්ද විකාශන පද්ධතියක් මිලදී ගැනිම, ඩිජිටල් කැමරාවක් හා පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම වැනි කාර්යාල අවශ්‍යතාවයන් සඳහා වැය කර ඇත.

### 2.5.4 ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු

2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සියලුම වැඩසටහන් වල මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු මේ හරහා සිදු කෙරේ. 2021 වර්ෂයේ දී මේ සඳහා රු.මි. 0.098 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වැය කිරීමට අපේක්ෂා කරන ලද අතර වර්ෂය අවසානයේ දී රු.මි. 0.035 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වැය කරමින් ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සිදු කර ඇත.

2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා හදබිම අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද රු.මි. 100.00 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මි. 99.757 ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් ඵලදායීව උපයෝගී කරගනිමින් සාර්ථක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

# අවසන් ගිණුම
# 2021

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීමේ සහ ගෘහාශ්‍රිත සත්ව පාලන
සහ සුළු ආර්ථික බෝග වගා ප්‍රවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

තැ. පෙ. 09, ගන්නෝරුව , පේරාදෙණිය

සභාපති : 0812 – 388075 නියෝජ්‍ය සභාපති : 0813 - 992726 විධායක අධ්‍යක්ෂ : 0812 - 388343 පොදු : 0812 - 388107

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306 / 72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මාණෙනි,

<u>2021.12.31 වන දිනට මූල්‍ය ප්‍රකාශනය</u>

2019.12.31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අවසන් ගිණුම් මේ සමඟ ඉදිරිපත් කරන්නෙමු. හදබිම අධිකාරියේ මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම් සම්මත කොමිටිය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් සම්මත ( SLPSAS ) වලට අනුකූලව පිළියෙල කරන ලදී.

ඔබගේ විශ්වාසනීය

අමරානන්ද වීරසිංහ
සභාපති

''සුරකිමු මිහිමඩල,,

ඊ-මේල් : authority.hadabima@gmail.com ෆැක්ස් : 0812-388132 වෙබ් අඩවිය: www.hadabima.gov.lk

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
# අවසන් ගිණුම - 2021

## පටුන


| අංකය | | පිටු අංකය |
|---|---|---|
| 1. | මූල්‍ය තත්ව ප්‍රකාශනය | 01 |
| 2. | ගිණුම්කරණ ප්‍රතිපත්ති | 02 |
| 3. | මූල්‍ය කාර්යසාධනය | 07 |
| 4. | මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | 08 |
| 5. | සමකොටස් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය | 09 |
| 6. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශන වල සටහන් සහ උපලේඛන | 17 - 47 |

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
## 2021. 12. 31. දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| 2020 ( රු. ) | | සටහන් | 2021 ( රු. ) |
|---|---|---|---|
| **එකතුව** | **වත්කම්** | | **එකතුව** |
| | **<u>ප්‍රවර්තන නොවන වත්කම්</u>** | | |
| 59,356,945.95 | දේපල පිරියත හා උපකරණ | | 48,296,993.91 |
| 2,221,745.00 | ජෛව වත්කම් | සටහන 01 | 1,903,450.00 |
| 17,890,152.01 | වෙළඳාම් සහ වෙනත් අය විය යුතු | සටහන 03 | 16,807,719.25 |
| 0.00 | ස්ථිර තැන්පතුව | සටහන 05 | 0.00 |
| 79,468,842.96 | ප්‍රවර්තන නොවන වත්කම් මුළු එකතුව | | **67,008,163.16** |
| | **<u>ප්‍රවර්තන වත්කම්</u>** | | |
| 4,517,245.57 | ඉන්වෙන්ටරිය / තොග | සටහන 02 | 4,482021.81 |
| 11,033,823.71 | වෙළඳාම් සහ වෙනත් අය විය යුතු | සටහන 03 | 11,910,969.35 |
| 7,000.00 | පූර්ව ගෙවීම් | සටහන 04 | 311,955.45 |
| 522,225.76 | සුරැකුම් තැන්පතු | සටහන 05 | 661,780.01 |
| | තැන්පතුව | සටහන 07 | - |
| 19,026,428.73 | බැංකු ගිණුම් | සටහන 06 | 28,801,001.30 |
| **35,106,723.77** | ප්‍රවර්තන වත්කම් එකතුව | | 46,167.727.92 |
| **<u>114,575,566.73</u>** | **වත්කම් එකතුව** | | **<u>113,175,891.08</u>** |
| | **<u>බැරකම්</u>** | | |
| | **<u>ප්‍රවර්තන බැරකම්</u>** | | |
| 3,912,705.33 | වෙළඳාම් සහ වෙනත් ගෙවිය යුතු | සටහන 07 | 5,218,293.59 |
| 22,263,257.90 | එකතු කළ වියදම් | සටහන 08 | 7,472,960.42 |
| 2,176,473.00 | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | සටහන 09 | 2,051,792.50 |
| 522,225.76 | සුරැකුම් තැන්පතු | සටහන 05 | 661,780.01 |
| **28,874,661.99** | ප්‍රවර්තන බැරකම් එකතුව | | **15,404,826.52** |
| | **<u>ප්‍රවර්තන නොවන බැරකම්</u>** | | |
| 24,055,742.00 | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | සටහන 09 | 23,285,845.00 |
| 5,732,336.13 | වෙළඳාම් සහ වෙනත් ගෙවිය යුතු | සටහන 07 | 10,252,731.84 |
| 250,000.00 | වාහන ණය | | 130,000.00 |
| 30,038,078.13 | ප්‍රවර්තන නොවන බැරකම් එකතුව | | 33,668,576.84 |
| 58,912,740.12 | **බැරකම් එකතුව** | | 49,073,403.36 |
| **<u>55,662,826.61</u>** | **ශුද්ධ වත්කම් එකතුව** | | **<u>64,102,487.72</u>** |
| | **<u>ශුද්ධ වත්කම් / සම කොටස්</u>** | | |
| 38,757,289.14 | රාජ්‍ය ප්‍රදාන ගිණුම | | 28,602,814.31 |
| 992,091.51 | සංචිත ගිණුම | | 992,091.51 |
| 1,087,229.82 | මූලධන සංචිත | | 1,087,229.82 |
| 2,091.79 | GTZ ප්‍රදාන | | 2,091.97 |
| 20,622,216.59 | ප්‍රත්‍යාගණන සංචිත ගිණුම | | 20,622,216.59 |
| ( 5,798,092.42 ) | අතිරික්ත හිඟය/අතිරික්තය | | 12,796,043.52 |
| **<u>55,662,826.61</u>** | **ශුද්ධ වත්කම් / සම කොටස් එකතුව** | | **<u>64,102,487.72</u>** |

පිටු අංක 02 සිට 06 දක්වා පිටුවල 17 සිට 36 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඊට සාක්ෂි වශයෙන් පහත අත්සන් කරන ලදී.

| ................................ | ................................ | ................................ | ................................ |
|---|---|---|---|
| ඒ.එම්.ඩබ්ලිව්. බී. තිලකරත්න | ඩබ්.එම්.කේ. කරුණාරත්න | මණ්ඩල සාමාජික | අමරානන්ද වීරසිංහ |
| සහකාර අධ්‍යක්ෂ ( මුදල් ) | විධායක අධ්‍යක්ෂ | | සභාපති |

සකස් කරන ලද්දේ

පරීක්ෂා කරන ලද්දේ

................................................................

පී.කේ. කැටකුඹුර
කළමනාකරණ සහකාර

…………...........................................

ඩබ්.එම්.එම්.එම්. ආරියරත්න
මූල්‍ය නිලධාරි

# ගිණුම් පිළිබඳ සටහන්

## 1 . සංස්ථාපිත තොරතුරු

1 . 1 මෙම ආයතනය 1972 අංක 11 දරණ කෘෂිකර්ම නීතිගත සංස්ථා පනතට අනුව 1978 පෙබරවාරි 01 දිනැති අංක 302 / 12 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය (නැඩ්සා) ලෙස මුලින්ම ස්ථාපනය කරන ලදී. 1978 සිට 2016 මාර්තු 15 වන දින දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පැවති මෙම අධිකාරිය 2016 මාර්තු 16 දිනැති අංක 1958 / 12 දරණ ගැසට් නිවේදනය මඟින් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදී. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය රජයට අයත් වෙනත් ව්‍යවසාය වල — " ඊ " උප කාණ්ඩය යටතේ වර්ග කර ඇත.

1 . 2 2021 වර්ෂයේ අවසානය වන විට අධිකාරියේ සේවක සංඛ්‍යාව 118 කි.

1 . 3 ශ්‍රී ලංකා හදබිම අධිකාරියට ලැබෙන ප්‍රධාන මූලික වශයෙන් භාණ්ඩාගාර අරමුදල් වේ.

1. 4 මහා භාණ්ඩාගාර අරමුදල් වලින් වැටුප් ලබන සේවකයන් යටතේ වන සංවර්ධන වැඩසටහන් වලට අත්‍යවශ්‍ය දෑ සැපයීම ගොවිපල මගින් සිදු වන අතර ගොවිපල විසින් දරනු ලබන වෙනත් වියදම් ගොවිපල ආදායමෙන් පියවා ගනු ලැබේ. ( කොත්මලේ හා පල්ලෙකැලේ )

1 . 5 අලෙවි ව්‍යාපෘතිය, 2019 ජනවාරි මස 31 වන දින සිට හදබිම සමූපකාර සමිතියට පවරා දෙන ලදී.

## 2 . පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2 . 1 ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති කොමිටිය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට අනුව පිළියෙල කරන ලදී.

2 . 2 ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මුදල් වර්ෂය දෙසැම්බර් 31 වන දායින් අවසන් වන ලිත් වර්ෂය වේ.

2 . 3 මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සම කොටස් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය යන ප්‍රකාශන SLPSAS 01 ට අනුකූල වේ.

2 . 4 චක්‍රලේඛ අංක 150 ට අනුව භාවිතයේ නොමැති වාහන බැහැර කිරීමෙන් ලද ආදායම භාණ්ඩාගාරය වෙතට ප්‍රේෂණය කරනු ලැබේ

## 3 . වත්කම්

3 . 1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අළුත්වැඩියා හා නඩත්තු වියදම් පෙන්වා ඇත්තේ දරන ලද වියදම් වශයෙනි. ප්‍රත්‍යාගණනය කළ අතිරික්තයක් වෙතොත් එය වත්කම් ප්‍රත්‍යාගණන සංචිත වල සම කොටස් වල සමුච්චිතයෙහි දක්වා ඇත.

3 . 2 2016 වර්ෂය දක්වා වර්ෂය තුළ සිදු කරනු ලබන මිල දී ගැනීම් සඳහා ක්ෂය වීම ලබා නොදෙන ලද අතර මේ වන විට අත් පත් කර ගන්නා ලද සියළු වත්කම් ( මෝටර් සයිකල් හැර ) , එකී වත්කම භාවිතයට යොදා ගත හැකි මාසය ආරම්භයෙන් ඇරඹී එතැන් සිට ක්ෂය වීම සිදු කරනු ලබන අතර බැහැර කරනු ලබන දිනයේදී ක්ෂය වීම සපයා දෙනු ලැබේ. මෝටර් සයිකල් සඳහා ක්‍රමක්ෂය සැපයීම වත්කම භාවිතයට යොදා ගත හැකි මාසය ආරම්භයෙන් ඇරඹී එතැන් සිට සිදු කරනු ලබන අතර බැහැර කරනු ලබන දිනයේදී ක්‍රමක්ෂය සපයා දෙනු ලැබේ.

3 . 3 2012 වර්ෂය දක්වා ප්‍රාග්ධන ක්‍රමයට ක්ෂයවීමේ ප්‍රතිපත්තිය අප විසින් භාවිතා කරන ලද අතර 2013 වර්ෂයේ සිට එම ක්‍රමයෙන් බැහැරව පුනරාවර්තන ප්‍රතිපත්තිය යොදා ගන්නා ලදී.

3. 4 ක්ෂය වීම ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සරල රේඛීය ක්‍රමය උපයෝගී කර ගනී.

| | |
|---|---|
| වාහන | - 25 % |
| කාර්යාලීය උපකරණ | - 10 % |
| ගොඩනැගිලි | - 2. 5 % |
| ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | - 7.5 % |
| කෘෂිකාර්මික උපකරණ | - 10 % |
| මෝටර් සයිකල් | - 20 % |

3. 5 ගොඩනැගිලි දේපල - පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ට නීත්‍යානුකූල අයිතියක් නොමැත.

• මහනුවර ගන්නොරුවේ පිහිටි කාර්යාල ගොඩනැගිල්ල සහ ඉඩම
• පල්ලේකැලේ සහ කොත්මලේ පිහිටි ගොවිපල ඉඩම්
• අවුරුදු 30 ක බදු කාලසීමාවක් සඳහා ලබා ගෙන ඇති වැලිගම පිහිටි අලෙවි මධ්‍යස්ථාන ඉඩම හා ගොඩනැගිල්ල

3. 6 වඩා අඩු පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගය අනුව ඉන්වෙන්ටරි අගය කිරීම සිදු කෙරේ.

3. 7 මුදල් හා මුදල් සමානතා, අත ඇති මුදල් හා බැංකු කෙටි කාලීන ආයෝජන ලෙස අර්ථ දැක්වේ.

3. 8 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ කාර්යය සඳහා , මුදල් හා මුදල් සමානතා වලට අත ඇති මුදල් හා බැංකු වල මුදල් තැන්පතු අන්තර්ගත වේ.

3.9. පහත සඳහන් වත්කම් 2021 දෙසැම්බර් 31 දින වන විට උපයෝගී කර නොගෙන පවතී

| **වත්කම් පිළිබඳ විස්තරය** | **වාහන අංකය** | **වටිනාකම (රු)** | **සටහන්** |
|---|---|---|---|
| කැබ්රථය-මිට්ෂුබිෂි | 27-5929 | 1,000,000.00 | වාහනය අලුත්වැඩියාව සඳහා ජේ.එන්.බී. ඔටෝ ට්‍රේඩ්ස් ආයතනයට යවා ඇත. |
| රෝද දෙකේ අත් ට්‍රැක්ටරය | | 195,000.00 | පල්ලේ කැලේ ගොවිපලේ අලුත්වැඩියාව යටතේ පවතී |
| කුණ්ඩසාලේ අලෙවි මධ්‍යස්ථානය | | 4,464,521.23 | ජල සහ විදුලි සැපයුම් ලබාගැනීම සඳහා කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙන් අවසර ලබාදී නැත. |

3.10. 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා හදබිම අධිකාරිය රු. 4,338,455.14 ක් වටිනා වත්කම් භාණ්ඩාගාර අරමුදල් භාවිතයෙන් මිලදී ගෙන ඇත.

## <u>4 . බැඳීම් හා ප්‍රතිපාදන</u>

### 4 . 1 කළ යුතු ගෙවීම්

කළ යුතු ගෙවීම් ඒවායේ පිරිවැයට අනුව ප්‍රකාශ කෙරෙයි.

### 4 . 2 පාරිතෝෂික

පාරිතෝෂික යනු අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුමක් වේ. අදාළ ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව පාරිතෝෂික ගෙවීමට අධිකාරිය බැඳී සිටී. මෙම බැඳීම පූර්ණ කිරීම සඳහා , සියළු සේවකයන්ගේ සේවා කාලයේ පළමු වර්ෂයෙන් ආරම්භව සේවා කාලයේ සම්පූර්ණ කෙරෙන එක් එක් සේවා වර්ෂයක් සඳහා මූල්‍ය වර්ෂයේ අවසන් මාසික වැටුපේ ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක් පදනම් කරගෙන ගණනය කරනු ලබන ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන යනු ලැබේ. වර්ෂයක් ආරම්භයේ ඉදිරියට ගෙන එන ලද ප්‍රතිපාදනය හා වර්ෂයක් අවසානයේ ඉදිරියට ගෙන යනු ලබන ප්‍රතිපාදනය අතර ඇති වන වෙනස සම්බන්ධයෙන් කටයුතු කිරීම ආදායම් ප්‍රකාශනයේදී සිදු කරනු ලබයි. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන , LKAS හි දැක්වෙන ආකාරයට අවම වශයෙන් එක් වර්ෂයක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන් සඳහා ගණනය කරනු ලැබේ. මහා භාණ්ඩාගාරය විසින් කල් ඇතිව අරමුදල් මුදා හරිනු නොලබන බැවින් පාරිතෝෂික සැලැස්මට උපකාර වශයෙන් කිසියම් අරමුදලක් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් ආයෝජනය කිරීමක් සිදු කර නැත. එසේ වුවද, පාරිතෝෂික සැලැස්මට සහාය වශයෙන් අලෙවි ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා ආයෝජන අරමුදලක් පවතී.

## 4 .3 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි අනුව සියළුම සේවකයෝ සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වීමට සුදුසුකම් ලබති. සේවක අර්ථසාධක අරමුදලෙන් හා සේවක භාරකාර අරමුදලෙන් ආවරණය වන සේවකයින් විසින් ලබා දෙනු ලබන දායකත්වය ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන්නේ වියදමක් වශයෙනි. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සේවක දළ වැටුපෙන් පිළිවෙලින් 12 % හා 3 % ක දායකත්වයක් අධිකාරියෙන් ලබා දෙනු ලැබේ

4.4. හදබිම අධිකාරියට එරෙහිව විභාගවෙමින් පවතින නඩුවල විස්තර

හදබිම අධිකාරියට එරෙහිව පනවා ඇති නඩුවල විස්තර පහත පරිදිය.

| | නඩු අංකය | විස්තරය | අධිකරණය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1 | 7389/Land | ඉඩමක් සම්බන්ධයෙනි | දිස්ත්‍රික් උසාවිය කුරුණෑගල | තීරණය ලබාදීමට නියමිතය |
| 2 | 7788/Land | ඉඩමක් සම්බන්ධයෙනි | දිස්ත්‍රික් උසාවිය කුරුණෑගල | තීරණය ලබාදීමට නියමිතය |
| 3 | DLM/20/20 | සී/ස හදබිම සමුපකාර සමිතිය<br>1. අතුරු තහනම් නියෝගයක්<br>2. අධිකරණයට අපහාස නඩුවක් පනවා ඇත. | දිස්ත්‍රික් උසාවිය - මහනුවර | තීරණය ලබාදීමට නියමිතය |
| 4 | DMR 1930/20 | සී/ස හදබිම සමුපකාර සමිතිය විසින් වන්දි ඉල්ලීම | දිස්ත්‍රික් උසාවිය මහනුවර | තීරණය ලබාදීමට නියමිතය |
| 5 | එ/67/2018 | අලෙවි මධ්‍යස්ථාන සේවකයින් හදබිම අධිකාරියට එරෙහිව | කම්කරු විනිශ්චය සභාව | තීරණය ලබාදීමට නියමිතය |

4.5. සී/ස හදබිම සමුපකාර සමිතිය ලබාගත් තහනම් නියෝගයට එරෙහිව හදබිම අධිකාරියේ අභියාචනය

| නඩු අංකය | විස්තරය | අධිකරණය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| CP/HC/CA/LA/19/29 | අංක DML 20/20 දරණ අතුරු තහනම් නියෝගයට අභියාචනය කිරීම සඳහා සී/ස හදබිම සමුපකාර සමිතියට එරෙහිව ශ්‍රී ලංකා හදබිම අධිකාරිය නඩුවක් පවරා ඇත. | පළාත් බද මහාධිකරණය මහනුවර | තීරණය ලබාදීමට නියමිතය |

## 5 . ප්‍රතිපාදන හා වෙනත් තොරතුරු

5.1. අනුමාන ණය සඳහා ප්‍රතිපාදන - ගම්පොල නිවාස ණය

5.2. 2019 ජනවාරි 31 දින සිට අලෙවි ව්‍යාපෘතිය හදබිම සමූපකාර සමිතියට බාර දෙනු ලැබ ඇත. හදබිම අධිකාරිය සමග ඇත. අවබෝධතා ගිවිසුමට සහ කල්බදු ගිවිසුමට අනුව ඔවුන් හදබිම අධිකාරිය වෙනුවෙන් සියලුම ජල, විදුලි සහ දුරකථන බිල්පත් ගෙවිය යුතුය. එහෙත් ඔවුන් 2021 දෙසැම්බර් 31 දිනය වන තෙක් ජල බිල්පත් සඳහා රු. 54,522.07 ක් විදුලි බිල්පත් සඳහා රු. 210,653 ක් හා සන්නිවේදන බිල්පත් සඳහා රු. 87,391 ක් ද ගෙවා නොතිබිණි.

5.3. අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර, ඉතුරුම් හා ජංගම ගිණුම්වල අරමුදල් සී/ස හදබිම සමූපකාර සමිතියට ප්‍රේෂණය කර නොමැති අතර 2021.12.31 දින වන විට එම ගිණුම්වල ශේෂ ඇමුණුම 01 හි ඉදිරිපත් කරනු ලැබ ඇත.

5.4 ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සහ සමූපකාර සමිතිය 2019.01.23 දින එළඹි අවබෝධතා ගිවිසුම සහ කල්බදු ගිවිසුමට අනුව අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියට අදාළ ස්ථාවර වත්කම් හදබිම සමූපකාර සමිතියේ භාවිතය සඳහා තාවකාලිකව පවරනු ලැබ ඇත. එම වත්කම්වලින් අයිතම කිහිපයක් හදබිම සමූපකාර සමිතිය භාවිතා කරන අතර අනෙක් අයිතම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ කල් බද්දට ලබාගත් ගොඩනැගිල්ල තුළ තබා ඇත. ඇමුණුම 02/03

## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
## 2021. 12. 31. දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය

| 2020<br>( රු. ) | | උප ලේඛනය | 2021<br>( රු. ) |
|---|---|---|---|
| **එකතුව** | **ආදායම** | | **හදබිම අධිකාරිය** |
| 100,425,275.00 | මහා භාණ්ඩාගාර අරමුදල - ( පුනරාවර්තන ) | 01 | 94,380,000.00 |
| 21,420,000.00 | මහා භාණ්ඩාගාර අරමුදල - ( මූලධන ) | | 100,000,000.00 |
| 23,860.00 | අමාත්‍යාංශ අරමුදල් - විශේෂ | | |
| 3,101,967.23 | වෙනත් ආදායම් | 02 | 2,966,652.84 |
| 14,267,782.95 | ක්ෂය වීම | | 14,397,898.82 |
| 13,720.00 | ගෘහ භාණ්ඩ හා උපකරණ විකිණීමෙන් ලද ලාබය | | 1,950.00 |
| 16,420.00 | කාර්යාල උපකරණ විකිණීමෙන් ලද ලාභය H | | 5,220.00 |
| 29,300.00 | කාර්යාල උපකරණ විකිණීමෙන් ලද ලාභය P | | 600.00 |
| 12,295.00 | ගෘහ භාණ්ඩ සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය P | | 700.00 |
| 13,950.00 | විවිධ ආදායම් H | | 5,775.00 |
| 8,435.00 | විවිධ ආදායම් P | | 3,950.00 |
| 17,500.00 | විවිධ ආදායම් K | | 0.00 |
| **139,350,505.18** | | | **211,762,746.66** |
| | **අඩු කිරීම් - වියදම්** | | |
| 65,101,118.24 | පුද්ගල පඩිනඩි | 03 | 65,185,703.84 |
| 1,989,156.25 | ගමන් වියදම් හා යැපීම් දීමනා | | 1,737,328.24 |
| 3,319,730.84 | සැපයුම්කරුවන් / ප්‍රවාහනය | | 3,846,055.51 |
| 8,587,362.79 | නඩත්තු වියදම් | | 12,803,972.29 |
| 3,181,425.15 | වෙනත් | | 1,737,211.06 |
| 14,267,782.95 | අගය අඩු වීම් | | 14,397,898.82 |
| 4,503,158.50 | පල්ලෙකැලේ ගොවිපලෙන් සිදු වූ අලාබ | | 1,412,013.47 |
| 3,496,573.31 | කොත්මලේ ගොවිපලෙන් සිදු වූ අලාබ | | 3,130,475.51 |
| 24,396,577.76 | සංවර්ධන වියදම් | 04 | 88,573,663.47 |
| 3,388,045.98 | සංවර්ධන වියදම් | | |
| 60,000.00 | බැහැර කිරීම් | | 60,000.00 |
| **132,290,931.77** | **මෙහෙයුම් වියදම් එකතුව** | | **192,884,322.21** |
| 7,059,573.41 | **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / ( හිඟය )** | | 18,878,424.45 |
| ( 12,857,665.83 ) | 2020. 01. 01 දිනට ඉදිරියට ගෙනා ශේෂය | | ( 6,082,380.93 ) |
| **( 5,798,092.42 )** | **කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ( හිඟය )** | | **( 12,796,043.52 )** |

## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
## 2021. 12. 31. දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2021 |
|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / ( හිඟය ) | 18,878,424.45 |
| පූර්ව වර්ෂ වල ගැලපීම් | 34,006.49 |
| ගැලපීම් ( 506943.49+43639.16 ) | (550,582.65) |
| ක්‍රමක්ෂය | 60,000.00 |
| ක්ෂයවීම | 688,806.21 |
| ස්ථිර තැන්පතුව සඳහා පොලිය | (290,821.91) |
| ස්ථාවර වත්කම් ලාභ විකිණීම් | (18,195.00) |
| | 18,801,637.59 |
| **මූල්‍ය නොවන සංචරණ** | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | (894,577.50) |
| දරන ලද වියදම් වැඩි වීම / අඩු වීම | ( 14,790,297.48 ) |
| ගෙවිය යුතු දේ වැඩි වීම / අඩු වීම | 5,825,983.97 |
| පූර්ව ගෙවීම්වල වැඩිවීම/අඩුවීම | 304,955.45 |
| තොග වැඩි වීම / අඩු වීම | 35,223.76 |
| වෙනත් ලැබිය යුතු දේ වැඩි වීම / අඩු වීම | 205,287.12 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **( 9,313,424.68 )** |
| | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ** | |
| දේපල පිරියත හා උපකරණ සංචරණ | ( 4,384,829.24 ) |
| ජෛව වත්කම් | 318,295.00 |
| ස්ථිර තැන්පතුව සඳහා පොලිය | 290,821.91 |
| ස්ථාවර වත්කම් විකිණීම් | 18,195.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **( 3,757,517.33 )** |
| | |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහ** | |
| මූලධන ප්‍රදාන | 4,163,876.99 |
| වාහන ණය | ( 120,000.00 ) |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | **4,043,876.99** |
| | |
| **මුදල් හා මුදල් සමානතා වලින් ශුද්ධ වැඩි වීම / ( අඩු වීම )** | 9,774,572.57 |
| 2021. 01.01 දින වන විට මුදල් හා මුදල් සමානතා | 19,026,428.73 |
| **2021. 12. 31 දින වන විට මුදල් හා මුදල් සමානතා** | **28,801,001.30** |

| | 2021 - 01- 01 | 2021 -12 - 31 |
|---|---|---|
| ජංගම ගිණුම- කාර්යාලය | 9,400,742.73 | 21,175,325.30 |
| සත් දින තැන්පතුව | 9,625,686.00 | 7,625,676.00 |
| | 19,026,428.73 | 28,801,001.30 |

**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය**

**2021 දෙසැම්බර් 31 දිනට ( රු. )**

| විස්තරය | ප්‍රදාන ගිණුම | සංචිත ගිණුම | මූලධන සංචිත | GTZ ප්‍රදාන | ප්‍රත්‍යාගණන ගිණුම | අතිරික්තය / හිඟය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ආරම්භක ශේෂය | 38,757,289.14 | 992,091.51 | 1,087,229.82 | 2,091.97 | 20,622,216.59 | ( 5,798,092.42 ) | 55,662,826.61 |
| පූර්ව වර්ෂයට ගැලපීම | | | | | | 34,006.49 | 34,006.49 |
| ගැලපූ ශේෂය | **38,757,289.14** | **992,091.51** | **1,087,229.82** | **2,091.97** | **20,622,216.59** | **( 6,082,380.93 )** | **55,378.538.10** |
| වර්ෂය සඳහා එකතු කිරීම | 4,348,938.43 | | | | | 18,878,424.45 | 23,227,362.88 |
| වර්ෂය සඳහා අඩු කිරීම | ( 185,061.44 ) | | | | | | ( 185,061.44 ) |
| වර්ෂය සඳහා අඩු කිරීම ( ක්ෂය වීම ) | ( 14,318,351.82 ) | | | | | | ( 14,318,351.82 ) |
| **වර්ෂයේ අවසානය සඳහා ශේෂය** | 28,602,814.31 | 992,091.51 | 1,087,229.82 | 2,091.97 | 20,622,216.59 | 12,796,043.52 | 64,102,487.72 |

**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය**

**2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම**

| ගිණුම | විස්තරය | පිටු අංකය | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|---|---|
| | **<u>ස්ථාවර වත්කම්</u>** | | | |
| | ගොඩනැගිලි ගිණුම | 01 | 27,984,414.66 | |
| | වාහන | 02 | 47,874,450.90 | |
| | යතුරු පැදි ( ණය ) | 03 | 1,990,220.00 | |
| | ගෘහ භාණ්ඩ සහ උපකරණ | 04 | 4,225,341.29 | |
| | කාර්යාල උපකරණ | 05 | 21,265,601.64 | |
| | කෘෂිකාර්මික උපකරණ | 06 | 3,549,591.75 | |
| | ජෛව වත්කම් | 07 | 1,903,450.00 | |
| | **<u>ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන</u>** | | | |
| | ගොඩනැගිලි ගිණුම | 08 | | 3,680,687.99 |
| | වාහන | 09 | | 35,861,975.93 |
| | මෝටර් වාහන | 10 | | 1,990,220.00 |
| | ගෘහ භාණ්ඩ සහ උපකරණ | 11 | | 2,342,802.96 |
| | කාර්යාල උපකරණ | 12 | | 11,488,442.21 |
| | කෘෂිකාර්මික උපකරණ | 13 | | 3,228,497.24 |
| | **<u>තොග පාලන ගිණුම</u>** | | | |
| | කෘෂිකාර්මික උපකරණ | 14 | 1,879,781.52 | |
| | ලිපි ද්‍රව්‍ය | 15 | 607,241.29 | |
| | විවිධ තොග | 16 | 36,486.50 | |
| | **<u>කොත්මලේ ගොවිපල</u>** | | | |
| | පැල | 17 | 908,515.00 | |
| | ලිපි ද්‍රව්‍ය | 18 | 1,104.55 | |
| | විවිධ තොග | 19 | 59,109.00 | |
| | **<u>පල්ලෙකැලේ ගොවිපල</u>** | | | |
| | විවිධ තොග | 20 | 7,538.00 | |
| | සත්ව තොග | 21 | 622,968.75 | |
| | පැල | 22 | 75,500.00 | |
| | <u>ණය ගැතියෝ</u> | | | |
| | ගම්පොල නිවාස ණය | 23 | 7,500.91 | |
| | ආපදා ණය | 24 | 16,443,479.43 | |

| ගිණුම | විස්තරය | පිටුව | හර රු | බැර රු. |
|---|---|---|---|---|
| | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 28 | 2,094,280.65 | |
| | වැටුප් වැඩිපුර ගෙවීම් | 29 | 6,853.75 | |
| | ලැබිය යුතු දෛනික කුලී | 30 | 2,719,200.00 | |
| | 2013 වාහන ණය ගැතියෝ | 31 | 0.15 | |
| | 2017 වාහන ණය ගැතියෝ | 32 | 43,333.02 | |
| | ලැබිය යුතු පල්ලෙකැලේ ගොවිපලේ ආදායම | 33 | 56,882.50 | |
| | ලැබිය යුතු කොත්මලේ ගොවිපලේ ආදායම | 34 | 1,595,660.00 | |
| | දෝෂ සඳහා අලෙවිකරන ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ශේෂය | **35** | 485,491.00 | |
| | යුනයිටඩ් මෝටර්ස් වෙතින් ලැබිය යුතු ආදායම | 36 | - | |
| | ලැබිය යුතු මැතිවරණ ශේෂය | 37 | - | |
| | අලෙවි අංශයෙන් ලැබිය යුතු ශේෂය - ජල බිල | 38 | 9,849.42 | |
| | අලෙවි අංශයෙන් ලැබිය යුතු ශේෂය - විදුලි බිල | 39 | 46,077.70 | |
| | හදබිම සමුපකාරයෙන් ලැබිය යුතු ශේෂය - ණය සඳහා පොලිය | 40 | 262,602.89 | |
| | ලැබිය යුතු දෛනික දීමනා ( හදබිම සමුපකාරයෙන්) | 41 | 2,585,300.00 | |
| | නොපියවූ අත්තිකාරම් | 42 | - | |
| | ඉන්ධන අත්තිකාරම් | 43 | 1,469.87 | |
| | උත්සව අත්තිකාරම් | 44 | 23,711.95 | |
| | විශේෂ අත්තිකාරම් | 45 | 4,000.00 | |
| | අනුමාන ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන | 46 | | 7,500.91 |
| | අග්‍රිම | 47 | | 5.00 |
| | ජල බිල් පත්, අලෙවි අංශය | 48 | 5,238.73 | |
| | **<u>තැන්පතු සහ පෙරගෙවුම්</u>** | | | |
| | ණය මත ලැබිය යුතු පොලී | 49 | 44,557.57 | |
| | ජාතික ඉතිරි කිරීමේ බැංකුව ( සුරැකුම් ) | 50 | 661,780.01 | |
| | ලැබිය යුතු තැන්පතු ( ජල සම්පාදන මණ්ඩලය ) | 51 | 3,500.00 | |
| | ලැබිය යුතු තැන්පතු(රක්ෂණ ) | 212 | 302,455.45 | |
| | විදුලිබල මණ්ඩලය | 52 | 6,000.00 | |
| | **<u>ප්‍රාග්ධන සහ සංචිත</u>** | | | |
| | සමුච්චිත ලාභ හා අලාභ | 53 | 6,116,387.42 | |
| | සංචිත ගිණුම | 54 | | 992,091.51 |
| | රාජ්‍ය ප්‍රදාන ගිණුම | 55 | | 28,602,814.31 |
| | ප්‍රාග්ධන සංචිතය | 57 | | 1,087,229.82 |

| | | | | |
|---|---|---|---|---|
| | GTZ ප්‍රදාන | 58 | | 2,091.97 |
| | ප්‍රත්‍යාගණන ගිණුම | 59 | | 20,622,216.59 |
| | **<u>ප්‍රවර්තන නොවන වගකීම්</u>** | | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 60 | | 25,337,637.50 |
| | වාහන ණය | 61 | | 130,000.00 |
| | සුරැකුම් තැන්පතු | 62 | | 661,780.01 |
| | **<u>ප්‍රවර්තන වගකීම්</u>** | | - | - |
| | උපචිත වියදම් | 63 | | 7,472,960.42 |
| | පාංශු සංරක්ෂණ වැඩසටහන | 66 | | 1,625,686.00 |
| | රඳවා ගැනීම් | 67 | | 5,519,848.61 |
| | බදු | 68 | | 9,975.00 |
| | පල්ලෙකැලේ ගොවිපල ( ණය ) | 69 | | 0.01 |
| | අලෙවි අංශය ( දෝෂ ) | 70 | | 575,000.00 |
| | අලෙවි මධ්‍යස්ථානය ණය | 71 | | 5,605,020.32 |
| | විවිධ අත්තිකාරම් | 72 | | 2,064.90 |
| | අලෙවි අංශයේ වත්කම් විකිණීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල | 73 | | 1,310.00 |
| | පස් සඳහා ගෙවිය යුතු මුදල | 74 | | - |
| | අලෙවි අංශය දෝෂ සඳහා රඳවා ගැනීම් | 75 | | 2,129,759.46 |
| | **<u>බැංකු ශේෂ</u>** | | | |
| | අංක 057100111338028 දරණ ගිණුම | 76 | 435,401.09 | |
| | අංක 057100131338046 දරණ ගිණුම | 77 | 11,314,923.77 | |
| | අංක 057100300018375 දරණ ගිණුම | 78 | 3,079,880.76 | |
| | අංක 057100130018376 දරණ ගිණුම | 79 | 2,308,991.76 | |
| | අංක 1 - 00152006430 දරණ ගිණුම | 80 | 3,783,933.59 | |
| | අංක 057200140019713 දරණ ගිණුම | 81 | 252,184.33 | |
| | සත් දින තැන්පතුව | 82 | 7,625,686.00 | |
| 1001.i | වැටුප් සහ වේතන | 83 | 50,430,668.56 | |
| 1001.ii | සේවක අර්ථසාධක අරමුදල 12 % | 84 | 5,936,240.22 | |
| 1001.iii | සේවක භාරකාර අරමුදල 03 % | 85 | 1,484,060.12 | |
| 1502 | පාරිතෝෂික | 93 | 2,121,020.00 | |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 86 | 2,245,822.94 | |
| 1003.i | සභාපති දීමනා | 87 | 900,000.00 | |
| 1003.ii | උප සභාපති දීමනා | 88 | 720,000.00 | |

| | | | | |
|---|---|---|---|---|
| 1003.iii | උපදේශන සහ විශේෂ දීමනා | 89 | 649,242.00 | |
| 1003.iv | අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 90 | 245,400.00 | |
| 1003.v | ටෙන්ඩර් තාක්ෂණික කමිටුව සඳහා දීමනා | 91 | 26,500.00 | |
| 1003.vi | අභ්‍යාසලාභී දීමනාව | 92 | 426,750.00 | |
| 1101 | සංචාර දේශීය | 94 | 1,737,328.24 | |
| 1102 | සංචාර විදේශීය | 95 | - | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 96 | 1,245,624.31 | |
| 1202 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 97 | 2,586,581.20 | |
| 1205 | පොත්, වාර ප්‍රකාශන හා පුවත්පත් | 98 | 13,850.00 | |
| 1301 | වාහන නඩත්තු කිරීම | 99 | 4,904,262.22 | |
| 1302 | කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 100 | 144,250.36 | |
| 1303 | ගොඩනැගිලි නඩත්තු කිරීම | 101 | 1,966,993.20 | |
| 1402.i | විදුලි සංදේශ | 102 | 1,243,993.86 | |
| 1402.ii | තැපැල් ගාස්තු | 103 | 147,820.03 | |
| 1403.i | විදුලි බලය | 104 | 136,083.13 | |
| 1403.ii | ජල බිල්පත් | 105 | 97,274.43 | |
| 1404.i | බලපත්‍රකරණය සහ රක්ෂණය | 106 | 552,498.00 | |
| 1404.ii | බදු | 108 | 33,841.69 | |
| 1409.i | දැන්වීම් | 107 | 446,391.00 | |
| 1409.ii | නීති වියදම් | 109 | 2,000.00 | |
| 1409.iii | ආරක්ෂක සේවා | 110 | 2,268,000.00 | |
| 1409.iv | මාර්ගස්ථ මුදල් | 111 | 17,990.37 | |
# 2021 දෙසැම්බර් මස 31 වන දිනට ලාභ සහ අලාභ ගිණුම

| | 2021 | |
|---|---|---|
| **විස්තරය** | | **එකතුව** |
| ගොවිපල නිෂ්පාදන විකුණුම් | | 10,143,605.20 |
| | | |
| 2021.01.01 දිනට තොගය | 706,006.75 | |
| එකතු කළා මිලදී ගැනීම් | 5,546,756.50 | |
| | 6,252,763.25 | |
| අඩු කළා 2021.12.31 දිනට තොග | 1,886,170.00 | |
| විකුණුම් පිරිවැය | | 4,366,593.25 |
| දළ ලාභය | | 5,777,011.95 |
| විවිධ ආදායම් | - | - |
| පරිපාලන වියදම් | | |
| ගොවිපල දීමනා | 66,927.00 | |
| වැටුප් සහ වේතන | 3,560,371.58 | |
| සේවක අර්ථසාධක අරමුදල | 450,382.00 | |
| සේවක භාරකාර අරමුදල | 107,321.70 | |
| විදුලි බලය | 402,455.80 | |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් | 514,690.30 | |
| අතිරේක ශ්‍රමිකයින් සඳහා වේතන සහ වැටුප් | 562,196.00 | |
| විදුලි සංදේශනය | 22,280.35 | |
| ජලය | 57,439.92 | |
| ඉදිකිරීම්/අලුත්වැඩියාව සහ නඩත්තුව | 116,712.00 | |
| වාහන ඇග්‍රිමේට් නඩත්තු කිරීම | 125,570.00 | |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 3,584.00 | |
| ක්ෂයවීම | 607,305.94 | 6,597,236.76 |
| | | |
| <u>විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්</u> | | |
| ඉන්ධන/ ප්‍රවාහන වියදම් | 148,428.50 | 148,428.50 |
| | | |
| <u>වෙනත් වියදම්</u> | | |
| නිහාරිකරණය | 113,408.00 | |
| කෘතිම සිංචනය | 4,480.00 | |
| ඖෂධ | 287,209.80 | |
| වෙනත් වියදම් | 38,262.36 | 443,360.16 |
| | | 7,189,025.42 |
| ශුද්ධ ලාභය / අලාභය | | <u>( 1,412,013.47 )</u> |
| | | |

**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය**

# 2021. 12. 31 දිනට ජෛව විද්‍යාත්මක වත්කම්

## 01. පල්ලෙකැලේ ඒකාබද්ධ ගොවිපල

| අංකය | කාරණය / වර්ගය | | සතුන් / පක්ෂීන් සංඛ්‍යාව | බර කිලෝග්‍රෑම් | ඒකකයක වටිනාකම රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 01 | **<u>සතුන්</u>** | | | | | |
| | **එළදෙනුන්** | | | | | |
| | | පරිණත | 8 | 2474 kg | 250.00 | 618,500.00 |
| | | කුඩා | 3 | 324 kg | 250.00 | 81,000.00 |
| 02 | **<u>පක්ෂීන්</u>** | | | | | |
| | i | ගෘහස්ථ කිකිළියන් | 964 | | 850.00 | 819,400.00 |
| | ii | සිල්කි කුරුල්ලන්ගේ මාපිය පක්ෂීන් | 22 | | 850.00 | 18,700.00 |
| | iii | තාරාවන්ගේ මාපිය පක්ෂීන් | 18 | | 1,500.00 | 27,000.00 |
| **එකතුව** | | | | | | **1,564,600.00** |

## 02. කොත්මලේ ඒකාබද්ධ ගොවිපල

| අංකය | කාරණය / වර්ගය | | සතුන් / පක්ෂීන් සංඛ්‍යාව | බර කිලෝග්‍රෑම් | ඒකකයක වටිනාකම රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 01 | **<u>සතුන්</u>** | | | | | |
| | **එළදෙනුන්** | | | | | |
| | | පරිණත | 3 | | 250.00 | 312,500.00 |
| | **පක්ෂීන්** | | | | | |
| | | කුඩා | 31 | | 850.00 | 26,350.00 |
| එකතුව | | | | | | 338,850.00 |
| | | | | | | |
| එකතුව | | | | | | **1,903,405.00** |

**උප ලේඛනය : - 01**

අලෙවි අංශය
දේපල පිරියත හා උපකරණ

| | **විස්තරය** | **පිරිවැය** |
|---|---|---|
| | | |
| 1 | ඉඩම් සහ ගොඩනැගිලි | 5,024,752.73 |
| | | |
| 2 | රථ වාහන | 4,000,000.00 |
| | | |
| 3 | කාර්යාලීය උපකරණ | 4,637,196.25 |
| | | |
| 4 | ගෘහ භාණ්ඩ සහ උපකරණ | 4,496,512.01 |
| | | |
| | | |
| | එකතුව | **18,158,460.99** |

උප ලේඛනය : - 02

අලෙවි අංශය

**ස්ථාවර තැන්පතු**

| | බැංකුව | ගිණුම් අංකය | තැන්පතු මුදල | 2021/12/31වන විට ශේෂය |
|---|---|---|---|---|
| 01 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව,-මුල්ගම්පොල | 2-0015-20-20157 | 500,000.00 | 1,344,642.15 |
| 02 | මහජන බැංකුව පේරාදෙණිය | 057-60-01-00016842-6 | 100,000.00 | 272,375.06 |
| 03 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100020 | 279,300.00 | 691,453.80 |
| 04 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100014 | 188,000.00 | 447,381.11 |
| 05 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100015 | 98,416.13 | 234,037.98 |
| 06 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100016 | 185,696.82 | 425,440.73 |
| 07 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100017 | 150,412.33 | 336,000.55 |
| 08 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 433030300398 | 82,364.82 | 191,145.83 |
| 09 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100009 | 107,181.20 | 237,855.90 |
| 10 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100008 | 87,411.09 | 193,982.22 |
| 11 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100010 | 67,161.60 | 142,863.43 |
| 12 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 43303030100313 | 57,288.00 | 114,350.51 |
| 13 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100012 | 33,091.13 | 68,761.51 |
| 14 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100011 | 66,680.37 | 138,558.27 |
| 15 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100013 | 96,699.45 | 200,936.42 |
| 16 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-100083 | 3,000,000.00 | 4,782,211.67 |
| 17 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-300318 | 286,651.50 | 514,916.89 |
| 18 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-300317 | 32,639.97 | 58,631.70 |
| 19 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-034-100124 | 99,917.73 | 158,656.82 |
| 20 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-300360 | 500,000.00 | 776,615.56 |
| 21 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-300361 | 500,000.00 | 776,615.56 |
| 22 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-300362 | 500,000.00 | 776,615.56 |
| 23 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-300363 | 500,000.00 | 776,615.56 |
| 24 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-300364 | 500,000.00 | 776,615.56 |
| 25 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 4-33-030-300365 | 500,000.00 | 776,615.56 |
| 26 | ලංකා බැංකුව | 80825710 | 800,000.00 | 1,150,789.43 |
| | එකතුව | | **9,318,912.15** | **16,364,685.34** |

**උප ලේඛනය : - 04**

අලෙවි අංශය

**ඉතිරි කිරීමේ ගිණුම්**

| | බැංකුව | ගිණුම් අංකය | 2021/12/31වන විට ශේෂය |
|---|---|---|---|
| | මහජන බැංකුව-පේරාදෙණිය | 057-1-001-4-1338201 | 1,208,638.30 |
| | මහජන බැංකුව- වැලිගම | 077-1-001-4-1650204 | 586,573.83 |
| | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 433011100044 | 4,816,699.95 |
| | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පේරාදෙණිය | 433011100055 | 82,332.95 |
| | මහජන බැංකුව පේරාදෙණිය | 057200110014854 | 803,894.68 |
| එකතුව | | | **7,498,139.71** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } කේඩීඒ/සී/එචඒ/සී/2022/84    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதි / Date } 2022 ජුනි ... දින

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
11 JUL 2022
ගන්නෝරුව

සභාපති,

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනසහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

යථොක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්. පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

පිටපත්: 01. ලේකම් - කෘෂිකර්ම අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } කේඩීඒ/සී/එචඒ/සී/2022/84 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජුනි දින

සභාපති,

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව වත්කම් වල සාධාරණ වටිනාකම එහි පවත්නා පොත් අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට ඒම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද රු.245,047 ක නාමික වටිනාකමක් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු කෘෂිකාර්මික උපකරණ තවදුරටත් භාවිතා කරමින් පැවතියද ඒම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ඒවායෙහි සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 28 ඡේදය අනුව භාණ්ඩ විකිණීමෙන් වන අයභාර හඳුනා ගැනීම සඳහා අස්ථිත්වය විසින් භාණ්ඩවල අයිතියේ අවදානම් හා ප්‍රතිලාභ මිලදී ගන්නාට පවරා තිබිය යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට පාරිභෝගිකයන් වෙත සපයා නොතිබුණු රු.1,417,200 ක ගොවිපළ නිෂ්පාදන වටිනාකමක් ණයට විකුනුම් අදායමක් ලෙස හඳුනා ගෙන තිබුණි. මේ නිසා සමාලෝචන වර්ෂයේ විකුණුම් ආදායම එම ප්‍රමානයට වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාලපරිච්ඡේදය තුළ අත්පත් කරගත් දේපල පිරියත හා උපකරණ වටිනාකම, එම වටිනාකමින් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මඟින් ලබාගත් දේපල පිරියත හා උපකරණ වටිනාකම සහ අධිකාරියේ මුදලින් ගෙවීම් කරන ලද වටිනාකම යන විස්තර සටහන් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් රු.4,384,829 ක වත්කම් සම්බන්ධව මෙකී තොරතුරු අනාවරණය කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත්ව තිබුණු ගිණුම් ශේෂ 2 ක් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරියට ගෙන ඒමේදී ඒවායේ අගය රු.1,144,056 ක් වැඩියෙන් ලෙජරයට පිටපත් කර තිබුණ නමුත් මෙම වෙනසට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරියෙන් ලැබිය යුතු ශේෂයන් ලෙස රු.54,911,756 ක් දක්වා තිබුණද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව ඊට අනුරූපී ගෙවිය යුතු ශේෂයක් දක්වා නොතිබුණි.එසේ වුවත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අධිකාරියට ලැබිය යුතු

ශේෂයක් ලෙස රු. 2,094,280 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, එම ශේෂය 1998 වර්ෂයේ සිට ඉදිරියට ගෙන ඒමින් පැවතුණි.මෙම පරස්පර විරෝධි තත්ත්වය පිළිබද සොයා බලා මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තත්ත්වය පෙන්නුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන රු.27,984,415 ක ගොඩනැගිලිවල අයිතිය අධිකාරියට පවරාගෙන නොතිබුණු නමුත් ඒ පිළිබද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ2021වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවනතොරතුරු, අනෙකුත් තොරතුරුයන්නෙන් අදහස් වේ.මෙමඅනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝමතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුවප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි .

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතිය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2(ඉ) ඡේදයේ දක්වා ඇති කරුණු හැර ඉකුත් වර්ෂයේදී මාවිසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින්

නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීති, රීති/විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3(ආ) මාර්ගෝපදේශය | රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සැපයුම් සඳහා වූ ගනුදෙනු සම්බන්ධයෙන් විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹීම අවශ්‍ය වුවද එම සීමාව ඉක්ම වූ සැපයුම් රු. 832,065 ක් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධාරීන් බඳවාගැනීම සඳහා වූ පරිපාටියේ 5.3(ii) ඡේදය | නියමකර තිබෙන විධිවිධාන අනුව පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරාගෙන පත්වීම් ලබාදිය යුතු වුවද පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගෙන පළමු ප්‍රමුඛතාවයේ සිට 4 වන ප්‍රමුඛතාවය දක්වා වූ ප්‍රමුඛතා ලැබූ අයදුම්කරුවන් හතරදෙනාට පත්වීම් ලබා නොදී ප්‍රමුඛතාවය 7,14 සහ 18 (18 යටතේ අයදුම්කරුවන් දෙදෙනෙක් ඇත.) ලබා සිටි අයදුම්කරුවන් 4 දෙනාට පත්වීම් ලබාදී තිබුණි. මේ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබුණු කුසලතා පිළිවෙල නොසලකා පත්වීම් ලබා දී තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ කලාප නිලධාරීන් බඳවාගැනීම සඳහා වූ පරිපාටියේ 4.3.3(1) ඡේදය | නියමකර තිබෙන විධිවිධාන අනුව පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරාගෙන පත්වීම් ලබාදිය යුතු වුවද පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවලදී ඉහළම ලකුණු ලබාගෙන පළමු ප්‍රමුඛතාවය හිමිකරගත් අයදුම්කරුට ලබානොදී 6 වන ප්‍රමුඛතාවය ලබාගත් අයදුම්කරුට කලාප නිලධාරී පත්වීම ලබා දී තිබුණි. |

මේ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබුණු කුසලතා පිළිවෙල නොසලකා පත්වීම් ලබා දී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

-----------------------------

(i) මුදල් රෙගුලාසි 188(2) — ගනුදෙනුකරුවන් විසින් සෘජුවම බැංකු ගිණුමට බැර කරන ලද මුදල්වලට අදාළ ගනුදෙනු හඳුනාගැනීමටත් ඒ අනුව ගිණුම් තැබීමටත් කටයුතු කළ යුතු වුවද අවස්ථා 80 කදී බැංකු ගිණුම් දෙකක එසේ තැන්පත් කරන ලද රු.625,340 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 396 — නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වුවද එවැනි චෙක්පත් 163 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙම චෙක්පත්වලින් රු.1,229,966 කට අදාළ චෙක්පත් 147 ක් 2020 සහ ඊට පෙර වර්ෂවලට අයත් ඒවා විය.

2.3.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව සම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2020 වසරේදී කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා ලබාදීමට මිලදී ගන්නා ලද උදළුතලයක් , මුල්ලුවක්, සවලක්, මල් බාල්දියක් සහ රේක්කයක් ඇතුළත් රු.7,516,260 ක කෘෂි උපකරණ කට්ටල 1860 ක් 2022 ජනවාරි 25 වන විටද, ප්‍රතිලාභීන් වෙත ලබා නොදී ගබඩාවේ රඳවාගෙන තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී පවුල් 10680 කට එම උපකරණ ලබාදීම සඳහා මිලදී ගත් රු.19,951,656 ක් වටිනා කෘෂි උපකරණද 2022 ජනවාරි 25 වන විටත් ගබඩාවේ රඳවා තිබුණි. එම කෘෂි උපකරණ අතර උදළුතල 2670 ක් උදළු මුල්ලු 6102 ක් සවල් 6102 ක් සහ මල් බාල්දි 5929 ක් ද තිබුණි.

(ආ) කුණ්ඩසාලේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.4,464,521 ක් වැය කර 2017 වර්ෂයේදී ඉදිකරන ලද අලෙවි ගොඩනැගිල්ල සඳහා ජලය සහ විදුලිය ආදී පහසුකම් ලබා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අවසර ලබා දී නොතිබුණු අතර භාවිතයට ගැනීම සඳහා ද විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙන බැවින් එම ගොඩනැගිල්ල අභාවිතව පැවතුණි. එසේම අධිකාරියට අයත් රු.1,000,000 ක කැබ් රථයක් සහ රු.195,000 ක අත් ට්‍රැක්ටරයක් වසර 03 ක කාලයක් භාවිතයෙන් තොරව පැවතුණි.

## 2.3 අනෙකුත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේදී පල්ලේකැලේ ගොවිපළ රු.1,412,013 ක්ද කොත්මලේ ගොවිපළ රු.3,130,475 ක්ද අලාභ ලබා තිබුණි. විකුණුම් ආදායම ඉක්මවා මෙහෙයුම් වියදම් ඉහළ යාම මෙසේ ගොවිපළ අලාභ ලැබීමට හේතු වී තිබුණි.

(ආ) කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවරයා විසින් 1978 පෙබරවාරි 01 දින අංක 302/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය අනුව අධිකාරිය විසින් උපරිම ඵලදාව සහ පරිසරය සුරැකෙන පරිදි ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය කිරීමට පියවර ගත යුතුය. එහෙත් පසුගිය වසර කිහිපයක වාර්ෂික ක්‍රියාකාරකම් සහ ප්‍රගති වාර්තාවල දැක්වෙන තොරතුරු අනුව දිය කඳුරු සංරක්ෂණය සහ පාංශු සංරක්ෂණය සඳහා ප්‍රමුඛතාවයක් ලබාදී නොමැති බව නිරීක්ෂණය විය. දිය කඳුරු සහ ජල මූලාශ්‍ර 100 ක් සංරක්ෂණය කිරීම සඳහා 2020 වර්ෂයේ සිට සැලසුම් කර තිබුණද 2020 වර්ෂයේදී සංරක්ෂණ කටයුතු කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එයින් ජල මූලාශ්‍ර 18 ක් පමණක් සංරක්ෂණය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.20,444,454ක් වන අතර ඉන් රු.16,807,719 ක් වසරක් ඉක්ම වූ ශේෂ බව නිරීක්ෂණය විය.එමෙන්ම ගෙවිය යුතු ශේෂය රු.9,866,005 ක් වූ අතර ඉන් රු.1,152,732ක් වසරක් ඉක්මවා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සතුව පැවති අලෙවි අංශයට සැපයුම්කරුවන් විසින් 2014 සහ 2015 වර්ෂවලදී සපයන ලද භාණ්ඩ වෙනුවෙන් වංචනික ලෙස දෙවරක් මුදල් ගෙවා තිබීම සම්බන්ධයෙන් කරන ලද විධිමත් විනය පරීක්ෂණයේ නිර්දේශ වාර්තාව අනුව නිලධාරීන්ගෙන් අය කරගත යුතු මුදල රු.2,116,410 ක් විය. ඉන් රු.844,251 ක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන තිබුණු අතර රු.1,272,159 ක මුදලක් තවදුරටත් අයකරගත යුතුව පැවතුණි.

(ඉ) මුදල් රෙගුලාසි 71 අනුව ගොවිපළවල් සඳහා අනුමත කාර්යමණ්ඩලක් ස්ථාපිත නොකර හදබිම අධිකාරියට අනුමත වූ කාර්යමණ්ඩලයේ සේවකයන් 12 දෙනෙකු යොදාගෙන කොත්මලේ සහ පල්ලේකැලේ පිහිටි ගොවිපළ පවත්වාගෙන ගොස් තිබුණි.

ඩබ්ලිව්. පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

## පරිච්ඡේදය 04: කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක ( ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%-90% | 75%-89% | 50%-74% |
| 1 | ස්ථාපිත පාංශු සංරක්ෂණ ව්‍යුහ හෙක්ටයාර ප්‍රමාණය | √ | | |
| 2 | නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර ප්‍රමාණය | √ | | |
| 3 | ගොවි තාක්ෂණික පුහුණු වැඩසටහන් ප්‍රමාණය | √ | | |
| 4 | සංරක්ෂණය කරන ලද ජල මූලාශ්‍ර ප්‍රමාණය | √ | | |
| 5 | සංවර්ධනය කරන ලද වාණිජ ගොවිපල ප්‍රමාණය | √ | | |
| 6 | ගොවීන් වෙත ලබා දුන් කුකුළු පැටවුන් ප්‍රමාණය | √ | | |
| 7 | ක්‍රියාත්මක කරන ලද බහුවිධ ආදායම් උත්පාදන වැඩසටහන් ප්‍රමාණය | √ | | |
| 8 | විද්්‍යුත් හා මුද්‍රිත වැඩසටහන් ප්‍රමාණය | √ | | |
| 9 | වර්ෂය තුළ අවසන් කරන ලද ප්‍රගති සමාලෝචන වැඩසටහන් ප්‍රමාණය | √ | | |
| 10 | අත්පත් කරගන්නා ලද භෞතික සම්පත් ප්‍රමාණය | √ | | |

## පරිච්ඡේදය 05 -තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

**5.1**හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| අරමුණු 01:<br>සියලු තැන්හි පවතින දුගී බව අවසන් කිරීම | 1.1 | 1.5.1 | | √ | |
| **අරමුණු 02:**<br>සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | 2.4 | 2.4.1 | | | √ |
| **අරමුණ 15:** | 15.2 | 15.2.1 | | | |
| භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරිම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනුරුත්ථාපනය සහ ජෛවවිවිධත්ව විනාශය නැවැත්වීම | 15.3 | 15.3.1 | | | √ |

තිරසර සංවර්ධන අරමුණු (SDG) වල අරමුණු 02 යටතේ, සඳහන් තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය උදෙසා 2021 වර්ෂය තුල පාංශු සංරක්ෂණ ව්‍යුහ හෙක්ටයාර 948ක් ස්ථාපිත කිරීමට සැලසුම් කොට තිබුනු අතර වර්ෂය අවසානයේ දී 100% ප්‍රතිශතයක ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. එමෙන්ම 2021 වර්ෂයේ දී ජල මූලාශ්‍ර හා දිය කඳුරු සංරක්ෂණ වැඩසටහන යටතේ සැලසුම් කරන ලද ජල මූලාශ්‍ර 18ම සංරක්ෂණය කොට 100% ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත.

එමෙන්ම සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීමට මෙන්ම ප්‍රෝටීන ශක්ති මන්දපෝෂණයට පිළියමක් වශයෙන් අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලන වැඩසටහන ක්‍රියාත්මක වූ අතර ඒ සඳහාද100% ප්‍රගතියක් අත්පත් කොට ගෙන ඇත.

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අධිකාරිය විසින් 2021 වර්ෂයේදී සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මූලික වශයෙන් තිරසර සංවර්ධන ඉලක්ක සපුරාලීමේ අදහසින් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2021 වර්ෂයේදී අර්ධ ගෘහාශ්‍රිත කුකුළු පාලනය වැඩසටහන හරහා තිරසරසංවර්ධන අරමුණු 02 වන සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීමට අදාල දර්ශකයන් සපුරා ගත හැකි විය.

විවිධ මානව ක්‍රියාකාරකම් නිසා විනාශයට පත්ව ඇති ජල මූලාශ්‍ර සහ තිරසර ඉඩම් කළමනාකරණය අරමුණු කොට ගනිමින් ආරම්භ කරන ලද පාංශු සංරක්ෂණ ව්‍යාපෘතිය,ජල මූලාශ්‍ර සංරක්ෂණය, කාබනික පොහොර නිෂ්පාදනය හරහා තිරසර සංවර්ධන අරමුණු 15 ට අදාල භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනුරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන දර්ශකයන් සපුරා ගත හැකි විය.

2021 වර්ෂයේදී තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රධානතම අභියෝගය වූයේ කොවිඩ් වසංගත තත්වය නිසා සෞඛ්‍ය ගැටලු නිසා ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම අපහසු වීම සහ දේශගුණික තත්වයන් ගේ වෙනස්වීමයි.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කලමණාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 06 | 06 | - |
| තෘතික | 18 | 18 | - |
| ද්විතියික | 56 | 56 | - |
| ප්‍රාථමික | 45 | 38 | 07 |
| එකතුව | 125 | 118 | 07 |

**ප්‍රාථමික මට්ටමේ පවතින පුරප්පාඩු පහත පරිදි වේ.**

| | |
|---|---|
| රියදුරු (PL-3) - | තනතුර - 02 |
| කාර්මික සහායක (PL-2) - | තනතුර - 01 |
| කාර්යාල කාර්ය සහායක (PL-1) - | තනතුර - 01 |
| රිය සහායක (PL-1) - | තනතුර - 02 |
| ගොවිපල කම්කරු (PL-1) - | තනතුර - 01 |

බහුකාර්ය කාර්යසාධන බලකා දෙපාර්තමේන්තුවෙන් ((PL-2) හා (PL-1) ට අදාළ තනතුරු පුරප්පාඩු සඳහා යෙදවීමට රිය සහායකයින් - 01, කම්කරු -01, පැල තවාන් සංවර්ධන සහායක - 03, ගොවි සහායක - 04, කෘෂිකර්ම ක්ෂේත්‍ර සහායක - 03 ලෙස අනියුක්ත කිරීම් සිදු කර ඇත.

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු

මානව සම්පත් හිඟය නිසා ආයතනයේ කාර්යක්ෂමතාව පහළ යාම සිදුවේ. මන්දයත් ආයතනය පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් තරම් සේවකයන් නොමැති වීම නිසා දැනට සිටින කාර්යමණ්ඩලයට විශාල කාර්යභාරයක් ඉටු කිරිමට සිදුවේ. එහෙයින් ඔවුනගේ කාර්යක්ෂමතාවය පහළ යාම සිදු වේ. එමෙන්ම ඔවුන්ට රැකියාව පිළිබඳ ඇති ස්වයං තෘප්තිය හීන වී යාම සිදුවේ.එමෙන්ම ඔවුන්ගේ නායකත්ව ගුණාංග ද පහළ යාම මේ හරහා සිදු වේ. එමෙන්ම මානව සම්පත් හිඟය නිසා ආයතනයේ ඉලක්ක වෙත ලඟා වීමට ද බාධා පැමිණේ.මානව සම්පත් අතිරික්තය නිසා ආයතනයේ සිටින සේවකයින්ගේ රැකියා තෘප්තිය පහළ යාම සහ ඔවුන් රැකියාවන් හැරයාම සඳහා පෙලඹේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

ක්ෂේත්‍ර නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් - 01 ක් පවත්වා ඇති අතර 2021 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කළ ද පැවති කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් අනෙකුත් පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

පුහුණු මානව සම්පත ආයතනයේ කාර්ය සාධනය උදෙසා ඉතා වැදගත් වේ. පුහුණු වැඩසටහන් ලබා දීම හරහා අයතනයේ සේවකයින්හට නව තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යානය කිරිමට අවස්ථාව උදා වේ. එමෙන්ම දැනට සේවකයින් සතුව ඇති දැනුම තවදුරටත් වර්ධනය කර ගත හැක. එමෙන්ම සේවකයින් සතු නායකත්ව ගුණාංගයන් වර්ධනය වීම සිදුවේ. එම නිසා ආයතනයේ පාලන අධිකාරිය වෙත ඉතා සුළු අධීක්ෂණය යටතේ කාර්යයන් සිදු කර ගැනීමට හැකියාව උදා වේ. එබැවින් පුහුණු වැඩසටහන් හරහා ආයතනයේ කාර්ය සාධනය ඉහළ නංවාගත හැක.

## පරිච්ඡේදය 07 : අනුකූලතා වාර්තා

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තිරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල නොවේ | 2021 ගිණුම සකස් කිරිමට අවශ්‍ය යම් තොරතුරු ප්‍රමාද වීම. | නියමිත වාර්තා 2/28 පෙර ලබා ගැනීම |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල නොවේ | අප අධිකාරිය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම වාර්තා ඉදිරිපත් නොකරයි. | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අනුකූල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරිම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරිම. | අනුකූල නොවේ | අධිකාරියේ ගිණුම් තොරතුරු ප්‍රේශණය සඳහා CIGAS භාවිතා නොවේ | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| **3** | **මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 3.2 | මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරිමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරිම. | අනුකූල වේ | - | - |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරිම.** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම. | අනුකූල වේ. | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරිම. | අනුකූල වේ. | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරිම. | අනුකූල වේ. | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරිම. | අනුකූල වේ. | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | - | - |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 7 | **විගණන හා කළමණාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමණාකරණ | අනුකූල නොවේ. | 2021 දී පැවැති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කමිටුව රැස් කිරීමට නොහැකි වීම මත වර්ෂයට අදාළ කමිටු 04න් කමිටු 03 ක් පමණක් පවත්වා ඇත. | ඉදිරියේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලැබී ඇත. |
| **8** | **වත්කම් කළමණාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරිම මු.රෙ.772 අනුව සිදු කිරිම. | අනුකූල වේ. | - | - |
| **9** | **වාහන කළමණාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම. | අනුකූල වේ. | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබිම. | අනුකූල නොවේ | අධිකාරිය සතුව ගර්හීත වාහන නොමැත. | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරිම. | අනුකූල වේ. | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරිම. | අනුකූල වේ. | - | - |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල වේ. | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමණාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබිම. | අනුකූල වේ. | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබිම. | අනුකූල වේ. | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වු හා ගැලපුම් කළ යුතුව තිබු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ. | යම් යම් අවස්ථා වල ප්‍රමාද වීම් පවති. | නියමිත දිනට ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වේ. |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබු ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කකළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම. | අනුකූල වේ. | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ. | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරිම. | අනුකූල වේ. | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ. | ණයගැතියන්ට දැන්වීම් කර ඇත. | - |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වු තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබිම. | අනුකූල වේ. | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබිම. | අනුකූල නොවේ. | මුදල් පනත අනුව අධිකාරිය සඳහා අදාළ නොවේ. | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබිම. | අනුකූල වේ. | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබිම. | අනුකූල වේ. | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | මාසිකව සැසඳුම් කිරිම. | | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබිම. | අනුකූල නොවේ. | ප්‍රේෂණය කල යුතු ආදායම් මාර්ග නොමැත | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබිම. | අනුකූල වේ. | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිම. | - | - | - |
| 16 | **මානව සම්පත් කළමණාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තුවක් ලිඛිතව ලබා දී තිබිම. | අනුකූල වේ. | - | - |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබිම. | අනුකූල වේ. | - | - |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරිමට පහසුකම් සලසා තිබිම. | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබිම. | - | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභීප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබිම. | අනුකූල නොවේ. | අංක 05/2008 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛයට අනුව පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තියක්සම්පාද නය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභීප්‍රඥප්තිය සම්පාදනය කිරිම හා ක්‍රියාත්මක කිරිමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබිම. | අනුකූල වේ. | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරිම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබිම. | අනුකූල නොවේ. | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන අංක 02/2018 අනුව මානව සම්පත් සැලැස්මක් කෙටුම්පත් කරමින් පවති. | - |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | - | - |